# 11 අපේකම සහ සහජීවනය

සහජීවනය නම් සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් ජීවත් වීමයි. එකමුතු ව කටයුතු කිරීමයි. එය මිනිස් සමාජයක තිබිය යුතු උසස් ලක්ෂණයක් ලෙස බුදුදහම සලකයි.
"සමවායෝ එව සාධූ" **සමගිය ම යහපති.** "සමග්ගා හෝථ මා විවදථ" **සමගි වන්න විවාද නොකරන්න** මේ බුදුරජාණන් වහන්සේ දී ඇති උපදෙස් ය. අසමගියේ ආදීනව මෙන් ම සමගියේ ආනිශංස ද බුද්ධ දේශනාවලත් බෞද්ධ කථා වස්තුවලත් උගන්වා තිබේ. සමගියෙන් හා සතුටින් විවාද නොකර කිරි සහ ජලය මෙන් පැහී එකමුතු ව එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් ජීවත් වීම බුදුරජාණන් වහන්සේ විසින් නොයෙක් විට අගය කර තිබේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව එබඳු සාමයක්, සමගියක්, සහජීවනයක් ඇති වීමට නම් අප ඇතැම් හානිකර ආකල්පවලින් බැහැර විය යුතු ය. එසේ ම බොහෝ යහපත් ආකල්ප වැඩි දියුණු කරගත යුතු ය. ආගම, ජාතිය, කුලය වැනි කරුණු මුල් කොට ගෙන එකිනෙකා දෙස වෛරයෙන්, නොසතුටින් බැලීම බුදු දහම අනුමත නොකරයි. බුදුරජාණන් වහන්සේ අවවාදයෙන් මෙන් ම ආදර්ශයෙන් ද විවිධ ආගම් සහ ජාති නියෝජනය කරන මිනිසුන් සමග සහජීවනයෙන් කටයුතු කිරීමට මග පෙන්වූහ. තමන් වෙත පැමිණි වෙනත් මතධාරීන් සුහද ව පිළිගෙන දීර්ඝ ලෙස සාකච්ඡා කළහ. ඇතැම් විට ඔවුන් දරූ මතවල අඩුපාඩු පෙන්වා දුන් නමුදු සුහදත්වය නැති කර නොගත්හ. එසේ ම ඇතැම් විට වෙනත් ජන කොටස් අතර සම්භාවනාවට ලක් වූ හොඳ දේ පිළිගත්හ. එබඳු දේ බෞද්ධයන් විසින් ද අනුගමනය කළ යුතු යැයි වදාළ අවස්ථා තිබේ. එසේ ම උන් වහන්සේ වෙනත් මතවාද ඉවසූහ. නිරතුරු ව ම මැදුම් පිළිවෙත ගරු කරමින් ක්‍රියා කළහ. අන්‍ය ආගමික ආරාමවලට පවා වැඩම කරමින් වෙනත් ආගමික උතුමන් සමග සුහද සාකච්ඡා සිදු කළහ. සමහර ආගමික උතුමන් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි සැටි ද, ඉතා උණුසුම් ලෙස ගරු සිරිත් පෙරදූරි ව උන් වහන්සේ පිළිගත් සැටි ද සූත්‍ර දේශනාවල විස්තර වේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව සසර දුකට ජාතියක්, ආගමක් හෝ කුලයක් නැත. සියලු ජාති ආගම් කුලවලට අයත් ව මිනිස්සු උපදිති. ලෙඩ රෝග ආදියෙන් පීඩා විඳිති. මහලු වී මිය යති. අප්‍රියයන් හා එක් වීමටත්, ප්‍රියයන්ගෙන් වෙන් වීමටත් ඔවුන් සැමට සිදු වේ. කැමැති දේ නොලැබීමත් සියලු මිනිසුන්ට උරුම ය. බුදුදහමේ මූලික අවධානය යොමු වී ඇත්තේ මෙකී සසර දුක ගැනයි. ජාතිය, ආගම, කුලය, කුමක් වුව ද මිනිස් වර්ගයා ඉදිරියේ ඇති මූලික මහා ගැටලුව නම් සසර දුක ය. දුක, දුක ඇති වීම, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මග ඉගැන්වෙන චතුරාර්ය සත්‍ය ධර්මය තුළ ජාතියක්, ආගමක් ගැන කියවෙන්නේ නැත. ත්‍රිලක්ෂණය ද එසේ ය. සියල්ල අනිත්‍ය ය, එබැවින් දුක් සහිත ය. අනාත්ම ය. එහි දී ද ජාති ආගම් ආදී වෙනස්කම් අදාළ නොවේ. පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල

ධර්මය ද සියලු ජාතීන්ට ආගමිකයන්ට පොදු ය. මෙසේ මූලික බෞද්ධ ඉගැන්වීම් කිසිවක ජාති ආගම් කුල හෝ වෙනත් විශේෂත්වයන් ගැන අවධානය යොමු කර නැත. බෞද්ධ ප්‍රතිපදාව ද එලෙසින් ම ජාතික ආගමික විෂමතාවලින් තොර වූවකි. පංචශීලය එක් නිදසුනක් වේ. පරපණ නැසීම පාපයක්, වරදක් ලෙස උගන්වන බුදු දහම ජාතිය ආගම හෝ සත්ත්ව කොට්ඨාසය කුමක් වුව ද එය සසර දුක් ඇති කරන, අප විසින් නොකළ යුතු, අත්හළ යුතු පාපයක් ලෙස පෙන්වා දී ඇත. හිංසනය ද එයට ම ඇතුළත් ය. මේ අයුරින් අන් සතු දේ ගැනීමෙන්, කාමමිථ්‍යාචාරයේ යෙදීමෙන්, රැවටීමෙන්, කවර තැනැත්තෙකුට හෝ හානි කිරීම බුදු දහම අනුමත නොකරයි. එහි දී කුමන ආගමකට හෝ ජාතියකට හෝ අයත් වුව ද මිනිසෙකුට එබඳු අවැඩක් කිරීමෙන් වළකින ලෙස උගන්වයි.

බුදු දහමෙහි ඉගැන්වෙන දානය, ජාතිය ආගම සැලකිල්ලට ගෙන කළ යුත්තක් නොවේ. කවර ජාතියකට ආගමකට අයත් වුව ද මිනිසෙකුට හොඳ හිතින් සතුටින් දන් දීම, පරිත්‍යාග කිරීම පින්කමකි. ප්‍රිය වචන කථා කිරීමේ දී ද ආගම් ජාති ආදී වෙනස්කම් නොසැලකේ. කවර ජාතිකයෙකු ආගමිකයෙකු වුව ද බොරුවෙන් රැවටීම, කේලමින් බිඳවීම, හිස් වදනින් මුලා කිරීම, රළු වදනින් වෙහෙසට පත් කිරීම වරදකි; පාපයකි. අර්ථචර්යාව යනු අනුන්ගේ දියුණුවට උදවු කිරීමයි. එහි දී ජාති ආගම් සලකා බැලිය යුතු යැයි කියා නැත. සමානාත්මතාවෙන් සංග්‍රහ කරමින් ජාතික ආගමික සමගිය, සහජීවනය ගොඩනගා ගැනීමට ඉහත කී සිවු සඟරාවත මග පෙන්වයි.

සිවු බඹ විහරණ ද එලෙසින් ම ජාතික, ආගමික වෙනස්කම්වලින් තොර ය. බුදුරජාණන් වහන්සේ වදාළ මෛත්‍රිය සියලු සත්ත්වයන්ටයි. අපට හිතවත් අයට මෙන් ම අහිතවත් අයට ද බෞද්ධයෝ මෙත් වඩති; සෙත සැපත ශාන්තිය ලැබේවායි සිතති; කරුණාව දක්වති; කවර ජාතියකට ආගමකට අයත් වුව ද මිනිසෙකුගේ දුකක දී කම්පනය වෙති; අනුකම්පා කරති; දයාව දක්වති; කාගේ වුව ද දියුණුවේ දී සතුටු වෙති; ඊර්ෂ්‍යා නොකරති; අකුල් නොහෙලති. ජාතික ආගමික විවිධත්වය තුළ බෞද්ධයෝ උපේක්ෂා සහගත වෙති; මධ්‍යස්ථ ව සිතති. අත්තූපනායික ධර්ම පර්යාය හෙවත් තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වා ඇති බුදු දහමට ජාතිය, ආගම පිළිබඳ විෂමතා අදාළ වන්නේ නැත.

බුදුරජාණන් වහන්සේ කිසි විටකත් සමකාලීන ව පැවති ආගමික අදහස්වලට එරෙහි නොවූහ. දාර්ශනික ව ඒවා විවේචනය කිරීම එරෙහි වීමක් නොවේ. උපේක්ෂාවෙන් හා සමානාත්මතාවෙන් යුතු ව මැදුම් පිළිවෙත මත පිහිටා ක්‍රියා කළ උන් වහන්සේ වෙනත් ආගම්වලට අවශ්‍ය ගෞරවය දැක්වූහ. බෞද්ධයන් වන අප එම ආදර්ශය මත කටයුතු කිරීම අගනේ ය. වෙනත් ආගම්වලට මෙන් ම ආගමික සිද්ධස්ථානවලට ද ගරු කිරීමත් හානි නොකිරීමත් අපගේ යුතුකමක් වෙයි. අපට අප පිළිගන්නා ආගම දහම අනුව කටයුතු කිරීමට නිදහස ඇත්තා සේ ම අන් ආගමිකයන්ට ද එම නිදහස ඇති බව සිහි තබා ගත යුත්තකි. ඒ අනුව වෙනත් ජාතිවලට ආගම්වලට අයත් ජන කොටස් සමග සුහද ව මිත්‍රශීලී ව කටයුතු කිරීමට බුදු සිරිතෙන් ද බුදු දහමින් ද අපට මග පෙන්වා තිබේ. මෙම ඉගැන්වීම් ඇසුරින් පෝෂණය වුණු අතීත ශ්‍රී ලාංකේය බෞද්ධයෝ, අන්‍යාගමිකයන්, අන්‍ය ජාතිකයන් සමග සුහද ව ජීවත් වූහ. ආගමික සමගිය යනු සියලු ආගම් ඇදහීම නොවේ. සෑම ආගමකින් ම උගන්වන්නේ එක ම දෙයකි යන සරල හා වැරැදි පිළිගැනීම ද නොවේ.

ඒ බව හොඳින් දැන සිටි ශ්‍රී ලාංකේය බෞද්ධයා කළේ අන්‍යාගමික උත්සව තමන් විසින් පවත්වනු ලැබීම නොවේ; අන්‍යාගමිකයන්ට තම ආගමික කටයුතු නිදහසේ කර ගැනීමට බාධා නොකරමින් තම බෞද්ධ පිළිවෙත් මනා ව පිළිපැදීමයි. අනන්‍යතාව සුරැකීම යනු එයයි. සමගිය වෙනුවෙන් තමන්ගේකම, අපේකම පාවා දීම ශ්‍රී ලාංකේය බෞද්ධයාගේ සිරිත නොවේ.

බෞද්ධයන් වශයෙන් අප කළ යුත්තේ දැහැමි රැකියාවන් ය. අදැහැමි ධනෝපායනය අත්හැර දැහැමි ධනෝපායනයෙන් (සම්මා ආජීවයෙන්) ජීවත් වීමට බුදු දහම උගන්වයි. එනම් තමාට මෙන් ම අනුන්ට ද අවැඩක් නොවන දිවි පැවැත්මයි. මෙම ඉගැන්වීම මත සිය ජීවන රටාව ගොඩනගා ගත් ශ්‍රී ලාංකික බෞද්ධයා මුල් තැන දුන්නේ කෘෂිකර්මය, වෙළෙඳාම වැනි දැහැමි රැකියාවන්ට ය. දැත දෙපය වෙහෙසවා දහදිය වගුරවා හරි හම්බ කර ගැනීම මදි පුංචි කමක් ලෙස නොසැලකී ය. කුඹුරේ, හේනේ අස්වැන්න සියල්ල ම නෙළා ගත්තේ නැත. කුරුල්ලන්ට ද කොටසක් ඉතිරි කිරීම සිරිත විය. වගා පාලු කරන සතුන් මරා දැමීම වෙනුවට කළේ ඔවුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට වෙනත් උපක්‍රම භාවිත කිරීමයි. ගවයන් ඇති කරන්නේ මස් පිණිස නොව කෘෂි කාර්මික කටයුතු සඳහා සහ කිරි ලබා ගැනීමට ය. මසට සතුන් ඇති නොකිරීම අපේ අනන්‍යතාවයි.

අලුත් අවුරුදු උත්සවය හැඳින්වෙන්නේ සිංහල දෙමළ යන විශේෂණ පද සහිත ව ය. එහි දී අප මුල් තැන දෙන්නේ සිංහල හා බෞද්ධ සිරිත් විරිත්වලට ය. පුණ්‍ය කාලය ගත කරන්නේ තෙරුවන වන්දනා කරමින් මවුපියන් වැඩිහිටියන් කමා කර ගනිමින් ය. නෑදෑයන් අතර, අසල්වාසීන් අතර අසමගිකම් නැති කර ගැනීමට, සුහදතාව වැඩි කර



ගැනීමට අවුරුදු චාරිත්‍ර යොදා ගැනීම අපේ සිරිත ය. සුරාවට සූදුවට මුල් තැන දීම අපේ අනන්‍යතාව නැති කර ගැනීමකි.

ගංවතුර, සුළි සුළං, නාය යෑම්, නියගය ආදි ස්වාභාවික විපත්වලට ජාතියක් නැත, ආගමක් නැත, කුලයක් නැත. සුනාමි ව්‍යසනය මීට හොඳ ම නිදසුනකි. එහි දී ලෝකයේ රටවල් රාශියක ද ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවක ද විසූ විවිධ ආගම් ඇදහූ විවිධ ජාතීන්ට අයත් මිනිස්සු විපතට පත් වූහ. අංගවිකල වූහ. සියලු සම්පත් අහිමි විය. අසරණ වූහ. විවිධ ආගම්වලට හා නොයෙක් ජාතීන්ට ඇතුළත් පවුල්වල බොහෝ දරුවෝ ද විවිධ විපත්වලට මුහුණ දුන්හ. මෙබඳු ආපදාපන්න අවස්ථාවක දී අප ක්‍රියා කළ යුත්තේ නිසැකව ම සහජීවනයෙනි, සමානාත්මතාවෙනි, සමගියෙනි. ජාතිය, ආගම සැලකිල්ලට ගෙන නොවේ. එබඳු ආපදා වළක්වා ගත හැක්කේ ද එබඳු විපතකින් මිදිය හැක්කේ ද අප එසේ ක්‍රියා කිරීමෙනි. එකාවන් ව කැප වීමෙන් කටයුතු කරමින් එකිනෙකාට උපකාර කරමින් වාද භේද අත්හැර එකමුතු ව කටයුතු කිරීමයි, අප කළ යුත්තේ. මෙම අනන්‍යතාව මනා ව ප්‍රකට කරමින් ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාව ක්‍රියා කළ අයුරු සුනාමි ව්‍යසනයේ දී දක්නට ලැබිණි. ස්වේච්ඡාවෙන් ම සංවිධානය වී ආපදාපන්න ප්‍රදේශවලට ගොස් ජාතිකත්වය, ආගමික භාවය නොවිමසා අසරණයන්ට උපකාර කළ අතර එහි දී මුල් තැන ගත්තේ පන්සල ය.

පාසල, රෝහල, බස් නැවතුම හා එහි ඇති සියලු දේ මෙන් ම මං මාවත් ආදිය ද අප කාටත් පොදු ය. ඒවා තනා ඇත්තේ එක් ජාතියකට අයත් හෝ එක් ආගමක් අදහන මිනිසුන් සඳහා හෝ නොවේ. අප සියලු දෙනා සඳහා ය. ඒවායින් සේවය සැලසෙන්නේ ද අප සියලු දෙනාට ම ය. එබඳු පොදු දේපළ හා සේවා ස්ථානවලට ජාතියක් ආගමක් නැත. එබැවින් ඒවාට හානි නොකිරීමත්, ඒවා රැක ගැනීමත් සියලු ජාතීන්ට, සියලු ආගමිකයන්ට අයත් යුතුකමකි. එබඳු කටයුතුවල දී ද අපට ජාතික ආගමික සහජීවනය අවශ්‍ය වෙයි. අප බෙදී සිටිය හොත් ඒවා රැක ගත නොහැකි ය. ඒවායින් නිසි ප්‍රයෝජන ගැනීමට ද ඉඩක් නොලැබේ.


මෙසේ බුදු දහම ද බුදු සිරිත ද අනුව අප ජාතික ආගමික සහජීවනයෙන් ක්‍රියා කරන අතර ම අපගේ අනන්‍යතාව ද රැක ගැනීමට වග බලා ගත යුතු ය. අපට අපේකමක් ඇත. අනෙක් ආගමිකයන්ට හා ජාතිකයන්ට ද ඔවුන්ගේකමක් ඇත. ඔවුන් විසින් ද ඔවුන්ගේ ආගම, ජාතිය, සිරිත්-විරිත්, පූජනීය ස්ථාන ආදිය රැක ගත යුතුවාක් මෙන් ම අප විසින් අපගේ ආගම, ජාතිය, සිරිත්-විරිත් හා සිද්ධස්ථාන ආරක්ෂා කර ගත යුතු ය. අපට ම අයත් සංස්කෘතියක් තිබේ. එය රැක ගනිමින් එයට අනුගත ව ක්‍රියා කිරීමේ යුතුකමක් අපට ඇත. පාසල් සිසුන් වශයෙන් අප සියලු ආගමිකයන් හා ජාතිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරන අතර ම අපගේ අනන්‍යතාව හෙවත් අපේකම රැක ගැනීමට ද කටයුතු කළ යුතු ය.

## සාරාංශය



ජාතික ආගමික සහජීවනය බුදු දහම කිසිසේත් ම බැහැර නොකරයි. මිනිසුන් වශයෙන් අප සියලු දෙනා එක් ව ජීවත් විය යුතු ය. චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය, ත්‍රිලක්ෂණය වැනි මූලික බෞද්ධ ඉගැන්වීම්වලට ජාතියක් නැත. ආගමක් ද නැත. බුදු දහමෙහි ඉගැන්වෙන පංචශීලය, සිවු සඟරාවත, සිව් බඹ විහරණ වැනි ඉගැන්වීම් තුළ ද ජාතික ආගමික වෙනසක් නොදක්වේ. බුදුරජාණන් වහන්සේ විසින් ද ජාතික ආගමික සහජීවනයේ වැදගත්කම ආදර්ශයෙන් පෙන්වා දී ඇත. එබැවින් ජාතික ආගමික වෙනස්කම් නොසලකා මිනිසුන් වශයෙන් ආපදාපන්න අවස්ථාවල දී ද පොදු දේපළ පරිහරණයේ දී ද සහජීවනයෙන් කටයුතු කරමින් වෙනත් ආගම්වලට හා සිද්ධස්ථානවලට ගරු කරමින් ක්‍රියා කිරීම බොදු දරුවන් වන අපගේ යුතුකමයි.

## ක්‍රියාකාරකම



1.) බහුජාතික බහුආගමික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් හඳුන්වා දෙන්න.

2.) බහුජාතික බහුආගමික පරිසරයක් තුළ පොදු දේපළ රැක ගැනීමට අදාළ වැඩ පිළිවෙළක් සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

3.) රැකියාවක් තෝරා ගැනීමේ දී ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරැකීම සඳහා ඔබගේ අවධානය යොමු කෙරෙන්නේ කුමන කරුණු කෙරෙහි දැයි පැහැදිලි කරන්න.

## පැවරුම



අන්‍ය ආගමික ස්ථානයක් නැරඹීමට ගොස් එහි දී ඔවුන් ඔබ පිළිගත් ආකාරය, ඔබ සමග ඔවුන් කටයුතු කළ ආකාරය සහ ඔබ ජීවිතයට අලුතින් එක් කර ගත් දේ ඇසුරින් චිත්‍රයක්, කවි පංතියක්, ලිපියක් හෝ චිත්‍ර කථාවක් නිර්මාණය කර බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න.